# පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
# மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
# POVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE

372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ<br>பணிப்பாளர்<br>Director | 025 - 2234673 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 025 - 2224173 | ෆැක්ස්<br>பெக்ஸ<br>Fax | 025 - 2224173 |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. | NCP/SS/D6/02/6 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015/10/[illegible] |


**<u>පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 02/2015</u>**

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියළුම සංවර්ධන සහකාර නිලධාරීන්/ සංවර්ධන නිලධාරී වෙත,

**<u>ක්ෂය රෝගීන් සඳහා ලබා දෙන මාසික ආධාර මුදල වැඩි කිරීම</u>**

රෝගී තත්ත්වය නිසා ආර්ථිකමය දුෂ්කරතාවයන්ට පත්වීම හේතුවෙන් රෝගියාගේ ශරීර සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය පිරිහීමට පත් වීම වලක්වා ගැනීමත්, රෝගියාගෙන් යැපෙන්නන් පෝෂණය කර ගැනීමට නොහැකි තත්ත්වයනට පත්වූවන් සඳහා සහනයක් සැලසීමත්, අඛණ්ඩව ප්‍රතිකාර ගැනීම සඳහා රෝගියා පෙළඹවීමත් අරමුණින් ක්ෂය රෝගීන් සඳහා මෙම දෙපාර්තමේන්තුව යටතේ මාසිකව ගෙවනු ලබන රු. 500.00ක ආධාර මුදල රු. 3000.00ක් දක්වා වැඩි කිරීමට තීරණය කර ඇත.

02. ක්ෂය රෝගය සම්බන්ධයෙන් ළය චිකිත්සාගාරයක ඒකක භාර වෛද්‍ය නිලධාරි විසින් එස්එස්/ටීබී/එම්1 ආකෘතියේ හෝ ඊට අදාල විධිමත් ආකෘතියකින් නිකුත් කෙරෙන වෛද්‍ය සහතිකයක් මත <u>එහි සඳහන් කාලසීමාව සඳහා පමණක් මෙම ආධාර මුදල ගෙවීම සිදු කළ යුතු අතර,</u> වෛද්‍ය නිර්දේශය නොමැතිව කිසිදු හේතුවක් නිසා ආධාර මුදල ගෙවනු ලබන කාලය දීර්ඝ කිරීම නොකළ යුතුය.

03. ඒ අනුව 2015 අගෝස්තු සිට මාසික ක්ෂය රෝගාධාර මුදල රු. 3000.00 ක් ලෙස වැඩිකර ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. තවද මේ වන විට රු. 500.00 බැගින් 2015 අගෝස්තු, සැප්තැම්බර් සඳහා ආධාර මුදල් ගෙවා ඇති ආධාර ලාභීන් සඳහාද ගෙවිය යුතු හිඟ මුදල් 2015 ඔක්තෝබර් මස ආධාර මුදල් ගෙවීමේ දී ගෙවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. මාසික ආධාර මුදල් ගෙවීම සඳහා ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුව වෙතින් අයදුම් කිරීමේදී ඉහත හිඟ ගෙවීම් සඳහාද ප්‍රතිපාදන අයදුම් කළ යුතු අතර, එම ඉල්ලීම් අනුව ප්‍රතිපාදන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

05. උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක NCP/CS/PT/FR/05/17 හා 2015.08.05 දිනැති ලිපියෙන් ලද අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අජන්ත ගුණවර්ධන,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.